“ළමා අපයෝජනයේ බලපෑම ජීවිත කාලය පුරාම පැවතිය හැකි අතර, එවැනි සිදුවීම්වලින් 90% ක්ම නිසි අධ්‍යාපනය සහ දැනුවත් කිරීම තුළින් වළක්වා ගත හැකි බව සිහි තබා ගත යුතුයී”



## ශ්‍රී ලංකාව තුළ පවතින තත්වය

ශ්‍රී ලංකාව තුළ ලිංගික අපයෝජනයට ලක් වූවන්ගෙන් 27.9% ක් වයස අවුරුදු 12ට අඩු අය වේ (කෙසේවෙතත් ඕනෑම වයසක ළමයෙකු ලිංගික අපයෝජනයේ ගොදුරක් විය හැක)

අපයෝජකයින්ගෙන් 94.5% ක් අපයෝජනය කරන අවස්ථාවේ දී දරුවා හොඳින් හඳුනන පුද්ගලයෙකු වේ (මෙවැනි අපරාධ ඔබ හඳුනන අය අතින් සිදුවීමට වැඩි ඉඩක් ඇත)

මෙවැනි අපරාධ සිදුව ඇති අවස්ථාවන් වල 31.1% ක් වින්දිත දරුවන් හට තර්ජන එල්ල වී ඇති අතර 15.2% ක් සඳහා අපරාධකරු විසින් ළමුන් රවටා ගැනීමට සෙල්ලම් බඩුවක් හෝ ආහාරයක් ලබා දී ඇත

අන් අයගෙන් ත්‍යාග හෝ තෑගි පිළිගැනීමට.

### දෙපාරක් හිතන්න!

ඔබ යම්කිසි අපයෝජනයක් හේතුවෙන් පීඩාවට පත් වී ඇත්නම්. එය ඔබගේ වරදක් නොවන බවත් ඔබ කිසි විටකත් තනිවී නොමැති බවත් සිතන්න. ඔබට උපකාරී කළ හැකි බොහෝ අය සිටී.

වහාම ඒ පිලිබඳව පහත සඳහන් දුරකථන අංක වලට දැනුම් දෙන්න;

- ජාතික ළමා ආරක්ෂක අධිකාරිය 1929
- පොලිස් ළමා හා කාන්තා කාර්යාංශය 011 2 444 444
- පීස් සංවිධානය 011 281 9397/071 273 3037

info@ecpat.lk
www.ecpat.lk

ecpat
SRI LANKA

PEaCE


# ඔබේ ශරීරය අයිති ඔබටයි



පරිසරය සහ සැමතැන වෙසෙන ළමුන් සුරැකීමේ සංවිධානය

# ඔබ කවුද?


ඔබට වයස අවුරුදු 18 ට අඩු නම් ඔබ ළමයෙකු වශයෙන් සැලකේ. එමෙන්ම ළමයින්ව රවටා ගොදුරුකරගැනීමට අපයෝජකයන් විවිධ ආකාරයේ උපක්‍රම අනුගමනය කරමින් සිටිති. කෙසේ වෙතත් ළමයෙක් වශයෙන් ඔබට මේ සමාජයේ ගෞරවාන්විතව ජීවත් වීමට සහ නිසි සංවර්ධනය සදහා අයිතියක් ඇත. දරුවන්ගේ යහපැවැත්ම සහතික කිරීම සෑම කෙනෙකුගේම වගකීමකි.
තවද දරුවන් ලිංගික සුරාකෑමට සහ අපයෝජනයට ලක් කිරීම දඬුවම් ලැබිය හැකි වරදක් බව තරයේ සිහි තබා ගත යුතුයි.



දරුවන් පහසුවෙන් අවධානමට ලක්විය හැකි කොට්ටාශයක් බැවින් විවිධ පුද්ගලයින් ඔබව ළමා අපයෝජනයේ ගොදුරක් බවට පත්කර ගැනීමට උත්සහ කරනු ලබයි. එමනිසා ළමා ලිංගික සුරා කෑම සහ අපයෝජනය සම්බන්ධයෙන් ඔබට පැහැදිලි අවබෝධයක් තිබිය යුතුයි බොහෝ විට ඔබ හොදින් හදුනන හෝ නාදුනන පුද්ගලයෙකු අතින් හිතාමතා හෝ නොදැනුවත්ව අපයෝජනයට ලක්විය හැක.

# ඔබගේ ශරීරය පිළිබඳව දැනුවත් වන්න

ඔබගේ ශරීරය අයිති ඔබටයි, කිසිවෙකුට ඔබේ ශරීරය ඔවුන්ගේ අයහපත් චේතනාවන් සඳහා භාවිතා කළ නොහැක.
යමෙකු ඔබගේ ශරීරය නුසුදුසු ලෙස ස්පර්ශ කළහොත් සහ එයින් ඔබට යම් අපහසුතාවයක් ඇති වේ. නම් ඒ පිළිබධව වහාම විශ්වාසවන්ත වැඩිහිටියෙකු දැනුවත් කරන්න.




බොහෝ විට අපරාධකරුවන් විවිධ ආකාරයේ නුසුදුසු හැසිරීම් වලින් පටන්ගෙන පසුව එම ක්‍රියා වඩාත් බරපතල අපරාධ බවට පරිවර්තනය කරනු ලබයි.

එබැවින් යෝග්‍ය සහ නුසුදුසු කායික සම්බන්ධතා පිළිබඳව දැනුවත් වීම එවැනි සිදුවීම් වලින් ආරක්ෂා වීමට ඔබට උපකාරී වේ.

මිතුරෙකු හෝ වැඩිහිටියෙකු සමඟ ඇති සම්බන්ධයක් ඔබව අපහසුතාවයට පත් කරන අයුරින් වෙනස් වීමට පටන් ගෙන ඇත්නම් වහාම එයට ඔබගේ අකමැත්ත ප්‍රකාශ කරන්න.

**එවැනි ක්‍රියා ප්‍රතික්ෂේප කිරීමට ඔබට අයිතියක් ඇත.**

# ළමා ලිංගික සූරාකෑම සහ අපයෝජනය අතර ඇති වෙනස පිළිබදව ඔබ දැනුවත්ද?

ළමා අපයෝජනයක් යනු ළමයෙකුට හානියක් වන වෙනත් පුද්ගලයෙකු (වැඩිහිටියෙකු හෝ තවත් ළමයෙකු) විසින් කරන ඕනෑම ආකාරයේ ක්‍රියාවකි. එය ශාරීරික හිංසනය, චිත්තවේගීය අපයෝජනය, ලිංගික අපයෝජනය හෝ නොසලකා හැරීම විය හැකියි.
ළමා ලිංගික සූරාකෑම යනු තවත් ආකාරයක ලිංගික අපයෝජනයක් වන අතර මෙහිදී වැඩිහිටියෙකු විසින් දරුවෙකුට යමක් ලබා දීමෙන් ලිංගික ක්‍රියාවන් සිදු කිරීමට පොළඹවයි. මෙයට තෑගි, මත්ද්‍රව්‍ය, මුදල්, ආදරය හෝ සෙනෙහස ආදිය ඇතුළත් විය හැකිය.



# ඔබට වැදගත් වන කරුණු කිහිපයක්

බලහත්කාරයෙන් ලිංගික සූරාකෑමට ගොදුරු වූවන්ගෙන් මිලියනයක් අතරින් 21% ක් වයස අවුරුදු 18 ට අඩු ළමුන් වේ (ජාත්‍යන්තර කම්කරු සංවිධානය).

ලොවපුරා මේ වන විට මිනිස් ජාවාරමට ලක්ව ඇති මුළු ළමුන් සංඛ්‍යාව මිලියන 5.5 ඉක්මවයි. මෙම දරුවන් බහුලව ලිංගික සූරාකෑමට/අපයෝජනයට, ප්‍රචණ්ඩත්වයට ලක්වන අතර බොහෝ විට ඔවුන්ව ගණිකා වෘත්තියේ යෙදවීමට, ළමා විවාහ සිදු කරදීම හෝ සිඟමන් යැදීම සදහා යොමු කෙරේ.
(ECPAT UK).